# කැලණිය විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව
# University of Kelaniya – Sri Lanka

**ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට කැලණිය විශ්වවිද්‍යාලයේ,** සමාජීය විද්‍යා පීඨයේ “ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය” මගින් හඳුන්වා දෙන ලද **ක්‍රීඩා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ** “දෙවන” කණ්ඩායම සඳහා **2019 සැප්තැම්බර් මස 03 දින සිට අයදුම්පත් කැඳවයි.**

## ක්‍රීඩා කළමනාකරණය
### ඩිප්ලෝමා පාඨමාලාව - 2019
### Diploma in **Sport Management - 2019**

රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන්, විවිධ ආයතනයන්හි ක්‍රීඩා ඒකක නිලධාරීන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්, ක්‍රීඩා සංගම් නිලධාරීන්, පුහුණුකරුවන්, විනිසුරුවන්, කළමනාකරුවන්, පළාත් සභා සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ සේවයෙහි නියුතු නිලධාරීන්, ක්‍රීඩා ගුරුවරුන්, ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ ක්‍රීඩා අංශයට අනුයුක්තව කටයුතු කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ නිලධාරීන්, ක්‍රීඩා මාධ්‍යවේදීන් හා ක්‍රීඩා ක්ෂේත්‍රයට ප්‍රවේශ වීමට අපේක්ෂිතයින්, ක්‍රීඩා රැකියා ක්ෂේත්‍රයේ නියත වූවන් හා ක්‍රීඩා කළමනාකරණ සහ ක්‍රීඩා පරිපාලන කුසලතා වර්ධනය කර ගැනීමට අපේක්ෂිතයන් ඉලක්ක කර ගනිමින් කැලණිය විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය මගින් ක්‍රීඩා කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලබයි.

**පාඨමාලා කාලය**
මාස 12

**පාඨමාලාව හැදෑරීම සඳහා අවම අධ්‍යාපන සුදුසුකම**
අ.පො.ස. (උ.පෙළ) ඕනෑම විෂය ධාරාවක් යටතේ විෂයයන් තුනකින් සමත් වීම **හෝ** අවම වශයෙන් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සාමාර්ථ්‍යය ලත් වසර 03ක **හෝ** ඊට වැඩි පලපුරුද්ද ඇති රජයේ හෝ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු පුද්ගලයින් **හෝ** අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සාමාර්ථ්‍යය ලත් ජාතික තලයේ **හෝ** පළාත් මට්ටමේ ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩිකාව වීම **හෝ** කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

**පාඨමාලා ගාස්තුව**
රුපියල් 60,000 (පාඨමාලා ගාස්තුව අදියර දෙකකින් ගෙවිය හැක)

**වැඩිදුර විමසීම්**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනෝමා රත්නායක - 0716127819
(පාඨමාලා සම්බන්ධීකාරක)

දුරකතන 0112903941, 0112903942, 0112903935
ඊමේල් anomar@kln.ac.lk
වෙබ් https://ss.kln.ac.lk/depts/sportscience


**විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රවීනයින් පමණක් පාඨමාලාව සඳහා දායකත්වය සපයයි.**

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2019 සැප්තැම්බර් මස 24**

## පාඨමාලාව සඳහා අයදුම් පත්‍රය

රුපියල් 750.00 මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවකින් 055-1001-1-0667549 ගිණුමට **ක්‍රීඩා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2019** නමින් බැර කර එම වවුචරය සමඟ සම්පූර්ණ කරන ලද අයදුම් පත තැපැල් මගින් හෝ කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ, ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය වෙත පැමිණ හෝ **පාඨමාලා සම්බන්ධීකාරක, ක්‍රීඩා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව, ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය දළුගම, කැලණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ හැක.(අයදුම් පත වෙබ් අඩවියෙන් හෝ අධ්‍යයන අංශයට පැමිණ ලබා ගත හැකිය.)

ලේඛකාධිකාරී,
කැලණිය විශ්වවිද්‍යාලය කැලණිය.
2019 සැප්තැම්බර් 03